# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1985 අංක 45 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 නොවැම්බර් මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1985 නොවැම්බර් මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1985 අංක 45 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 නොවැම්බර් මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 73/84

**1969 අංක 7 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1985 අංක 45 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1969 අංක 7 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ 7 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2) වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව තිබුණද (1) වන උපවගන්තිය යටතේ සන්තකය පිළිබඳ රිට් ආඥාවක් නිකුත් කිරීම හෝ නැවත නිකුත් කිරීම, ඒ සන්තකය ලබා ගැනීම පිළිබඳ රිට් ආඥාව නිකුත් කිරීම හෝ නැවත නිකුත් කිරීම පිළිබඳව හෝ ඒ සන්තකය ලබා ගැනීම පිළිබඳ රිට් ආඥාව නිකුත් කරනු ලබන්නේ යම් අභියාචනයක් ප්‍රකාර ද ඒ අභියාචනයේ නිවේදනය පිළිබඳව හෝ ප්‍රශ්න කිරීමේ අරමුණින් යම් අධිකරණයක දී ගෙන ඇති හෝ ගැනීමට අදහස් කර ඇති යම් ක්‍රියාමාර්ග හේතු කොට ගෙන කිසිම ආකාරයකින් නතර නොකළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ රජයේ නිවාස වලින් නීති විරෝධී ලෙස නෙරපා හරිනු ලැබ ඇතැයි කියා සිටින යම් තැනැත්තකු විසින්, අලාභ හෝ වෙනත් සහන හෝ සඳහා නඩු පවරනු ලැබීමෙන් ඔහු වළක්වන්නේ යයි මේ පනතෙහි සඳහන් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.".

**3.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම දිනයේදී යම් මහේස්ත්‍රාත් අධිකරණයක, ඒ අධිකරණය වෙත ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය යටතේ නිසි බලධරයා විසින් ඉදිරිපත් කරන ලද යම් ඉල්ලුම් පත්‍රයක් විනිශ්චයට භාජන වෙමින් ඇත්නම්, ඒ අධිකරණය විසින් ඒ ඉල්ලුම් පත්‍රය පිළිබඳව, මේ පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන වලට අනුකූලව විභාග කොට තීරණය කළ යුතු ය. විනිශ්චයට භාජනව ඇති ඉල්ලුම් පත්‍ර ආදිය.

2—ජ 086520—6,750 (85/10)

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුවම දිනයේ දී, යම් නිසි අධිකරණ බලය ඇති අධිකරණයක ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ නිසි බලධරයකු විසින් කරන ලද යම් ක්‍රියාවක් හෝ නිකුත් කරන ලද අස්කිරීමේ නිවේදනයක් පිළිබඳව හෝ මහෙස්ත්‍රාත්වරයකු විසින් කරන ලද ආඥාවක් පිළිබඳව වූ යම් කාරණයක් විනිශ්චයට භාජන වෙමින් ඇත්නම් ඒ නිසි අධිකරණ බලය ඇති අධිකරණය විසින් ඒ කාරණය පිළිබඳව, මේ පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන වලට අනුකූලව විභාග කොට තීරණය කළ යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන ඒක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.